# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,885 - 2014 ඔක්තෝබර් මස 17 වැනි සිකුරාදා - 2014.10.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1822 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1827 |


සැ. යු.-අරුන්දික ප්‍රනාන්දු සහන සේවා සහ ගොඩ්ෆ්‍රි ප්‍රනාන්දු අනුස්මරණ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2014 සැප්තැම්බර් මස 19 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 නොවැම්බර් මස 07 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 ඔක්තෝබර් මස 24 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


1819- B 80883—2,875 (2014/10)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත හටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු — ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — කළුතර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2014 නොවැම්බර් මස 17 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2014 ඔක්තෝබර් මස 01 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| කළුතර | ඉංගිරිය | රත්මල්ගොඩ කොට්ඨාසයේ උප්පැන්න හා මරණ සහ රයිගම කෝරළය කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර. |

10-728

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — කෑගල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2014 නොවැම්බර් මස 17 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2014 ඔක්තෝබර් මස 01 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| කෑගල්ල | අරණායක | ගල්බඩ කෝරළය කොට්ඨාසයේ දිප්පිටිය ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය. | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කෑගල්ල. |

10-729

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — කළුතර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2014 නොවැම්බර් මස 17 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2014 ඔක්තෝබර් මස 01 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| කළුතර | බණ්ඩාරගම | රයිගම කෝරළය කොට්ඨාසයේ අටළුගම ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය. | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර. |



## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — බදුල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2014 නොවැම්බර් මස 17 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2014 ඔක්තෝබර් මස 01 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| බදුල්ල | මහියංගණය | ගිරාඳුරුකෝට්ටේ කොට්ඨාසයේ උප්පැන්න මරණ හා විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල. |

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

### නිලධාරි පුරප්පාඩු

ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදාවේ පාලන අධ්‍යාපන ශාඛාවේ ඉදුරාම අධිකාරියට පත්කොට බඳවා ගැනීමට පිරිමි අපේක්ෂකයින් සඳහා පුරප්පාඩු පවතී. :-

2. පහත සඳහන් වෘත්තීය සුදුසුකම් ඇති පිරිමි අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. :-

(අ) පාලන අධ්‍යාපන ශාඛාව
ප්‍රංශ භාෂා පරිවර්තක - පිරිමි (ස්වේච්ඡා)

* පිළිගත් විශ්ව විද්‍යාලයක ප්‍රංශ භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ශාස්ත්‍රවේදී උපාධියක් ලබා තිබීම; *හෝ*

* අ. පො. ස. (උ/පෙළ) විභාගය සඳහා ප්‍රංශ භාෂාව විෂයයක් ලෙස හදාරා විෂයයන් තුනකින් සමත්ව තිබීම සහ DELF/ DALF ජාත්‍යන්තර ඩිප්ලෝමා පාඨමාලාවන්හි B2 හෝ C1 මට්ටමින් ශ්‍රේණිගතව සිටිය යුතු ය.

* අයදුම්කරුවන් ප්‍රංශ භාෂාව කථා කිරීම සහ ලිවීම පිළිබඳව මනා දැනුමක් සහ පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

3. *අනෙකුත් සුදුසුකම් :*

(අ) *පුරවැසිභාවය :* ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය ;
(ආ) *සිවිල් තත්වය :* විවාහක/අවිවාහක ;
(ඇ) *ස්ත්‍රී පුරුෂ භාවය :* පිරිමි
(ඈ) *වයස :* 2014 ඔක්තෝම්බර් මස 15 වැනි දිනට අවුරුදු 35 ට නොවැඩි විය යුතුය;
(ඉ) *උස :* පිරිමි - අඩි 5 අඟල් 5 ක් හෝ ඊට වැඩි විය යුතු ය;
(ඊ) *බර :* ශරීර ස්කන්ධ දර්ශකය ගුවන් හමුදා ශාරීරික නිපුණතා පරීක්ෂණ ප්‍රමිතියට අදාළව විය යුතුයි.

$$\text{ශරීර ස්කන්ධ දර්ශකය} = \frac{\text{බර (කි. ග්‍රෑ)}}{\text{උස}^{2}\text{ (මී)}}$$

(උ) *පපුව :* අඟල් 32ට නොඅඩු විය යුතුයි (පිරිමි);
(ඌ) *වර්ණ දෘෂ්ටිය :* සීපී2;
(එ) *දෘෂ්ටි තීක්ෂණත්වය :* වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් සහිතව හෝ රහිතව).

4. යම් අයදුම්කරුවෙකුගේ උස නියමිත පරිදි නොමැති වුවද හමුදා සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවයක් ඇත්නම් ගුවන් හමුදාධිපතිගේ මනාපය පරිදි ඔහු ගැන සලකා බලනු ලැබේ.

5. ගුවන් හමුදාධිපතිවරයා විසින් නියම කරනු ලබන වෛද්‍ය පරීක්ෂණයකින් සමත්වීමට හැකි ආකාරයට මනා සෞඛ්‍ය තත්ත්වයකින් සිටිය යුතු ය.

6. ක්‍රීඩා ක්ෂේත්‍රයේ වර්තමාන විශිෂ්ඨ දක්ෂතා ලබා තිබීම පිළිබඳව නිසි සැලකිල්ලක් දක්වනු ලැබේ.

7. *රාජ්‍ය භාෂා අවශ්‍යතා :—* තෝරාගනු ලබන අපේක්ෂකයින් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස විශේෂයෙන් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් දැනට පවත්නා, පනවා ඇති සහ මතු පනවනු ලබන්නා වූ ද ව්‍යවස්ථා පිළිපැදිය යුතු ය.

8. තෝරාගනු ලබන අපේක්ෂකයින්ට ඔවුන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව ගුවන් හමුදාවේ පයිලට් ඔෆිසර් හෝ ෆ්ලයින් යන නිලයන්හි ස්වේච්ඡා අධිකාරියට පත්කරනු ලැබේ.

9. තෝරාගනු ලබන අපේක්ෂකයින් ගුවන් හමුදාධිපති විසින් තීරණය කරනු ලැබිය හැකි ස්ථානයක දී පුහුණුවක් ලැබිය යුතු ය. පුහුණුවන අවස්ථාවේ දී විෂමාචාරය නිසා හෝ තමාට පාලනය කරගත හැකිව තිබූ වෙනත් කරුණු නිසා හෝ නිලධාරියෙකුට නුසුදුසු බවට වගකිව යුත්තන් විසින් වාර්තා කරනු ලැබුවහොත් එම නිලධාරියාට පිරිනමනු ලැබූ අධිකාරිය ආපසු ගැනීම සහ/හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විනය රෙගුලාසිවලට අනුකූලව වෙනයම් විනයානුකූල ක්‍රියාමාර්ගයන්ට යටත්වීමට හෝ බැඳී සිටින්නේය.

10. විටින් විට පනවනු ලබන ගුවන් හමුදා නියෝග අනුව ගුවන් හමුදා නිලධාරීන් පාලනය කරනු ලැබේ.

11. 1951 අප්‍රේල් මස 27 වැනි දින අංක 10,240 දරන *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරනු ලැබූ කලින් කල සංශෝධනය කරන ලද, ශ්‍රී ලංකා ගුවන් හමුදා (නිත්‍ය හා නිත්‍ය උපසේවා) රෙගුලාසි අනුව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිලධාරියෙකුගේ සේවා කොන්දේසි වේ. සුදුසුකම් අනුව ෆ්ලයිට් ලෙප්ටිනන්ට් හෝ උසස් නිලයක නිත්‍ය/ස්වේච්ඡා අධිකාරියක් පිරිනමනු ලැබේ. ගුවන් හමුදා පනතේ 10 වැනි වගන්තිය අනුව "සෑම නිලධාරියෙකුම සේනාධිනායකයාගේ මනාපය පරිදි තම පත්වීමේ සිටිය හැක". කෙසේ වෙතත් තම අධිකාරියෙන් අස්වීමට නිලධාරියෙකුට බලයක් නැති අතර, ගුවන් හමුදා පනතේ 11 වැනි වගන්තිය අනුව සේනාධිනායක විසින් අස්වීමට ඉඩදිය හැක. ගුවන් හමුදාවේ විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂිත රෙගුලාසිවලට අනුව ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගැනීමට හැකි වේ.

12. ගුවන් හමුදා නිලධාරීන් රාජකාරි හෝ පුහුණුව සඳහා ඕනෑම අවස්ථාවක දී ලෝකයේ කවර තැනකට වුව ද යවනු ලැබීමට යටත් වේ.

13. අවිවාහක නිලධාරීන්, නිලධාරි නිවස්නයේ වාසය කළ යුතු ය. ගෘහ භාණ්ඩ සහ නවාතැන් පහසුකම් හා ආහාරපාන ඔහුට/ඇයට සපයනු ලැබේ. බැට්මන් සේවය ද සපයනු ලැබේ. අවිවාහක නිලධාරීන්ගේ ආහාර දීමනාව සහ බැට්මන් දීමනාව භෝජනාගාරයට ගෙවනු ලැබේ.

14. විවාහක නිලධාරීන්ට විවාහක නිවාස ඇත්නම් සපයනු ලැබේ. මේ සඳහා රජයේ ආයතන සංග්‍රහයට අනුව කුලිය අයකරනු ලැබේ. විවාහක නිලධාරීන් විවාහක නිවස්නයක වාසය කරනු නොලබන්නේ නම් 15 (ආ) (17) ඡේදයේ පරිදි නිවාස කුලී දීමනාවන් හිමි වේ.

15. (අ) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරි ලත් නිලධාරීන්ගේ වැටුප් පහත සඳහන් පරිදි වේ :

පයිලට් ඔෆිසර් - රු. 2,42,700 වසරකට
ෆ්ලයින් ඔෆිසර් - රු. 2,75,220 — 34 x 7,740 = රු. 5,38,380 වසරකට
ෆ්ලයිට් ලෙප්ටිනන්ට් - රු. 3,21,660 — 28 x 7,740 = රු. 5,38,380 වසරකට
ස්කොඩ්‍රන් ලීඩර් - රු. 3,52,620 — 24 x 7,740 = රු. 5,38,380 වසරකට
විංග් කමාන්ඩර් - රු. 3,62,100 — 20 x 9,480 = රු. 5,51,700 වසරකට
ග්‍රෑප් කැප්ටන් - රු. 4,41,060 — 18 x 12,600 = රු. 6,67,860 වසරකට

(ආ) (15) (ඇ) ඡේදයේ දැක්වෙන සේවා දීමනා අදාල පරිදි අමතරව ගණනය කරනු ලැබේ.

(ඇ) *අනෙකුත් දීමනා :*

(1) ජීවනාධාර දීමනාව මසකට රු. 6,600 ක් ගෙවනු ලැබේ.
(2) සේවා කාලය වසර පහක් සම්පූර්ණ කළ පසු දිරි දීමනා වශයෙන් මසකට රු. 250 ක් ගෙවනු ලැබේ.
(3) දුෂ්කර දීමනා මසකට රු. 600 ක් ගෙවනු ලැබේ.
(4) ක්‍රියාන්විත සේවයේ සේවය කරන්නන් හට රු. 4,400 ක් ගෙවනු ලැබේ.

(5) විශේෂ දීමනාව මසකට රු. 3,000ක් ගෙවනු ලැබේ. (රාජකාරි දිනකට රු. 100 බැගින් ගෙවනු ලැබේ.).
(6) අතිරේක දීමනාව මසකට රු. 1,000 ක් ගෙවනු ලැබේ.
(7) නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාව මසකට රු. 255.00 ක් ගෙවනු ලැබේ.
(8) බැට්මන් දීමනාව මසකට රු. 637.50 ක් ගෙවනු ලැබේ. (පිටත වාසය කිරීමට අවසර ලැබූවන් සඳහා).
(9) ආහාර දීමනාව මසකට රු. 14,449.80 ක් ගෙවනු ලැබේ. (පිටත වාසය කිරීමට අවසර ලැබූවන් සඳහා).
(10) සුදුසුකම් වේතනය අදාළ පරිදි (මසකට උපරිමය රු. 637.50 ක්) ගෙවනු ලැබේ.
(11) විශේෂ දීමනාවක් ලෙස මසකට මූලික වැටුපෙන් 20% මුදලක් ගෙවනු ලැබේ.
(12) නොමිලේ ගමන් කළ හැකි දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් වසරකට (නිලධාරියාට/බිරිඳ/සහ දරුවන්ට) දෙනු ලැබේ.
(13) කඳවුර තුළ වාසය කරන නිලධාරීන්ට මසකට වරක් නිලධාරි නිවස්නයේ සිට තම නිවාසයට යෑම සහ ඒමට අතිරේක දුම්රිය ගමන් බලපත්‍රයක්, කට්ටලයක් හෝ බස් ගාස්තු ගෙවනු ලැබේ.
(14) නිල ඇඳුම් හා ඊට අදාළ අනෙකුත් භාණ්ඩ නොමිලේ සපයනු ලැබේ.
(15) නොමිලේ වෛද්‍ය පහසුකම් (තම පවුලේ සාමාජිකයන්ට අදාළ පරිදි).
(16) පිටත වාසය කිරීමට බලය දී ඇති විවාහක නිලධාරීන්ට සැතපුම් 30ක් තුළ රාජකාරි ස්ථානයට නොමිලේ ගමන් කිරීම සඳහා මධ්‍යම ගමනාගමන මණ්ඩලයේ බලපත්‍රයක් දෙනු ලැබේ.
(17) රජයේ නිවාසවල වාසය නොකරන විවාහක නිලධාරීන්හට පහත සඳහන් පරිදි නිවාස කුලී දීමනාවක් හිමි වේ. පයිලට් ඔපිසර් සිට ගෲප් කැප්ටන් සහ ඊට ඉහළ නිලයන් සඳහා මසකට රු. 1,600 සිට රු. 4,250 දක්වා.

16. *විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා.*—විටින් විට සංශෝධනය කරනු ලැබූ සහ 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහය අනුව විශ්‍රාම වැටුප් පාරිතෝෂික දීමනා ගෙවනු ලැබේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලට සියලුම නිලධාරීන් දායකයන් වේ. වැන්දඹු හා අනත්දරු (සන්නද්ධ සේවා) අරමුදලේ දායක මුදල් 1970 රෙගුලාසි අනුවය.

17. *ඉල්ලුම්කරුවන්ට උපදෙස් :–*

(*අ*) පහත දැක්වෙන ආකෘති පත්‍රයට අනුව ඉල්ලුම්පතේ සියලුම කොටු හැකි පමණ විස්තර හා පැහැදිලිව සම්පූර්ණ කළ යුතු ය. ඉල්ලුම්පත් 2014 ඔක්තෝබර් මස 24 වැනි දින මධ්‍යහ්න 1200ට හෝ ඊට පෙර ලැබෙන සේ "විධායක ආධුනිකයින් බඳවා ගැනීමේ නිලධාරි, ආධුනිකයින් බඳවා ගැනීමේ කාර්යාලය, ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ඒකල, කොටුගොඩ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම්පත් බහාලන කවරයේ "පාලන අධ්‍යාපන ශාඛාවේ අධිකාරියක් සඳහා ඉල්ලුම්පත" යනුවෙන් සඳහන් විය යුතු ය. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට හා වේලාවට පසුව සහ මෙම නිවේදනයේ අවශ්‍යතාවයන්ට අනුකූල නොවන ඉල්ලුම්පත් සලකා බලනු නොලැබේ.

(*ආ*) රාජ්‍ය සේවයේ/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතනයන්හි සේවයෙහි නිරත වූවන් ස්වකීය ඉල්ලුම්පත් ඒ ඒ දෙපාර්තමේන්තු/ සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය. යම් හෙයකින් අයදුම්කරු තෝරාගතහොත් තම කාර්යයෙන් නිදහස් කරන බවට සේවා යෝජකයා විසින් ලිපියක් මගින් දැනුම් දිය යුතු ය.

(*ඇ*) ඉල්ලුම්පත් සමග අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකපත් වල පිටපත් ඉදිරිපත් කළ යුතු ය :

(1) උප්පැන්න සහතිකය;
(2) ලබා ඇති උසස්ම අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික;
(3) ඉල්ලුම්කරු පෞද්ගලිකව දන්නා වගකිව යුතු පුද්ගලයන් යටත් පිරිසෙයින් දෙදෙනෙකුගෙන් ලබාගත් චරිත සහතික;
(4) ක්‍රීඩා, ශිෂ්‍ය භට පුහුණු ආදී සනාථ කරන සහතික;
(5) ඉල්ලුම්පතේ යම් යම් හිමිකම් කර ඇතොත් ඒවා සනාථ කරන සහතික.

*සැලකිය යුතුයි.-* මෙම සහතිකවල මුල්පිටපත් ඉදිරිපත් කළ යුත්තේ අපේක්ෂකයා සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබුවහොත් ඒ අවස්ථාවේ දී පමණි.

18. ඉල්ලුම්පතේ අසත්‍ය ප්‍රකාශයක්කර තිබේ නම් එම අසත්‍යතාවය අපේක්ෂකයා තෝරා ගැනීමට ප්‍රථම හෙළිදරව් වුවහොත් ඔහුගේ අපේක්ෂකත්වය අහිමිවීමට ද, තෝරාගනු ලැබීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු සේවයෙන් පහකරනු ලැබීමට ද යටත් වේ.

19. *තෝරාගැනීම, සම්මුඛ පරීක්ෂණ ආදිය :–*

(*අ*) ඉහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලන අයදුම්කරුවන් මූලික තේරීම්වලට භාජනය කරනු ලැබේ. එසේ තෝරා ගනු ලබන අයදුම්කරුවන්ට ගුවන් හමුදාධිපති විසින් නියම කරනු ලබන පරිදි පරීක්ෂණවලට හා වෛද්‍ය පරීක්ෂණවලට පෙනී සිටීමට සිදු වන්නේය. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය මගින් පත්කරනු ලබන තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අවසාන තේරීම කරනු ලැබේ.

(*ආ*) සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයින්ට සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන ස්ථානය, වේලාව සහ දිනය ලිපියකින් දැනුම් දෙනු ලැබේ. මේ සම්බන්ධයෙන් දරනු ලබන ගමන් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

(*ඇ*) මෙම තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුවෙකු කැඳවනු ලබන සෑම අවස්ථාවකදීම පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ඔහු විසින් ඉදිරිපත් කළ යුතුය.

(*ඈ*) අවසාන සම්මුඛ පරීක්ෂණයට සුදුස්සන් විය හැකි අපේක්ෂකයන් ගුවන් හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියේ පෙනී සිටිය යුතුය.

(*ඉ*) අපේක්ෂකයකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුවත්, එසේ කළ යුත්තේ ඔහුට සහතිකයක් දීමෙනි. අපේක්ෂකයෙකු තෝරා ගැනීම සඳහා කවර ආකාරයකින් හෝ පෙළඹවීම නැතහොත් බලපෑම් කිරීමට උත්සාහ දැරීම එම අපේක්ෂකයා නුසුදුස්සෙකු වීමට හේතු වන්නේය.

(*ඊ*) බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අපේක්ෂකයින් වෙත ඒ බව දන්වා එවනු නොලැබේ.

කේ. ඒ. ගුණතිලක,
එයාර් මාර්ෂල්,
ගුවන් හමුදාධිපති.

මූලස්ථානය,
ශ්‍රී ලංකා ගුවන් හමුදාව,
තැ. පෙ. 594,
කොළඹ.

**ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාවේ ........... ශාඛාවේ අධිකාරියක් සඳහා ඉල්ලුම්පත**

1. පුරවැසිභාවය :————.
(ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින් ද, ලියාපදිංචි වීමෙන් ද යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න.).

2. සම්පූර්ණ නම (ජාතික හැඳුනුම්පතට අනුව) :————.

3. ජාතික හැඳුනුම්පත් අංකය :————.

4. ඉල්ලුම් කරන ශාඛාව :————.

5. ඉල්ලුම් කරන තනතුර :————.

6. ස්ථිර ලිපිනය :————.

7. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :————.

8. තැපැල් ලිපිනය :————.

9. උපන් දිනය :————.

10. උස : අඩි :———— අඟල් :————.

11. දිස්ත්‍රික්කය :————.

12. ඡන්ද කොට්ඨාසය :————.

13. ග්‍රාම සේවක කොට්ඨාසය :————.

14. දුරකථන අංකය :————.

15. විවාහක හෝ අවිවාහක බව :————.

16. පාසල් සහ/හෝ විශ්වවිද්‍යාල පිළිබඳ විස්තර :

| පාසලේ/ විශ්වවිද්‍යාලයේ නම | සමත් විභාගය | විභාගයට පෙනී සිටි වර්ෂය | සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුලුව) |
|---|---|---|---|
| | අ.පො.ස. (සා.පෙළ) :<br>අ.පො.ස. (උ.පෙළ) :<br>වෘත්තීය සුදුසුකම් :<br>වෙනත් : | | |

17. පාසලෙන්/විශ්වවිද්‍යාලයෙන් ඉවත් වූ පසු කළ රැකියා පිළිබඳ විස්තරඃ

| සේවා යෝජකයාගේ නම සහ ලිපිනය | රැකියාවේ ස්වභාවය | සේවා කාලය | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| | | | |

18. මව්පියන් පිළිබඳ විස්තර :-

| සම්පූර්ණ නම | උපන් ස්ථානය | රැකියාව | දැනට ලිපිනය |
|---|---|---|---|
| පියා :- | | | |
| මව :- | | | |

19. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් :————.

20. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ටතා පිළිබඳ විස්තර ඃ (ඔබ සහභාගී වූ තරඟ සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ටතා දක්වන්න.) :————.

21. පාසලේ දී, විශ්වවිද්‍යාලයේ දී හෝ බාහිර සංවිධානවල දී දක්වා ඇති වෙනත් විශිෂ්ටතා (දිනයන් සමග විස්තර දක්වන්න) :————.

22. සන්නද්ධ සේවා හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ හෝ ඇති පෙර සේවය :————.

23. ශ්‍රී ලංකා ගුවන් හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලීසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මින් පෙර ඉල්ලුම් කර තිබේ ද ? එසේ නම්, ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්න. :————.

24. සිවිල් හෝ යුද්ධ උසාවියක දී වැරදිකරු වී හෝ ඇඟ බැඳ තිබේ ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න. :————.

25. රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය අංශයෙහි/ මණ්ඩලයක/ සංස්ථාවක (මහ බැංකු, ජාතික බැංකු, විශ්වවිද්‍යාල, රජය විසින් පාලනය කරන සිවිල් ව්‍යාපාර, සමාගම් ආදිය ඇතුළුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු :————.

26. චරිත සහතික පිළිබඳ විස්තර :

| නම | පදවිය | තැපැල් ලිපිනය |
|---|---|---|
| | | |

27. *අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය :*

පූර්වෝක්ත ප්‍රශ්නවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වූ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරී සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙල හා ඒ අයට අදාළවන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධකර ගතිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

10-724

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

### දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2014

#### ව්‍යවස්ථා සහ නිර්දේශ පත්‍රය

01. 2014 වසරට නියමිත දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2015 පෙබරවාරි මස අග සති අන්තයක දී දිවයින පුරා පිහිටුවනු ලබන විභාග මධ්‍යස්ථානවල දී පවත්වනු ලැබේ.

02. *විභාග මධ්‍යස්ථාන.*—උපලේඛනයේ දක්වා ඇති සෑම දිස්ත්‍රික්කයක් තුළම අයදුම්කරුවන්ගේ සංඛ්‍යාව අනුව විභාග මධ්‍යස්ථාන පිහිටුවනු ඇත.

එහෙත් යම් නගරයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවන අවස්ථාවල දී එකී නගරයේ විභාග මධ්‍යස්ථානය අවලංගු කොට අදාළ අයදුම්කරුවන් ඊට ආසන්නව පිහිටි වෙනත් විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කිරීමට සිදුවනු ඇත. විභාග මධ්‍යස්ථාන පිහිටුවන දිස්ත්‍රික්ක හා නගර දැක්වෙන ලැයිස්තුව I වැනි උපලේඛනයෙහි දක්වා ඇත.

03. *භාෂා මාධ්‍යය.*—මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන්ම පවත්වනු ලැබේ.

04. *සුදුසුකම්.*—මෙම විභාගය සඳහා ඉල්ලුම් කරන සෑම අයදුම්කරුවකු ම පහත දක්වා ඇති සුදුසුකම් අතුරෙන් යටත් පිරිසෙයින් කවර හෝ එක් සුදුසුකමක් සපුරා තිබිය යුතු ය.

4.1 දහම් පාසලක නව වැනි ශ්‍රේණිය සමත් වී දහම් පාසල් අවසාන සහතික පත්‍ර පන්තියේ යටත් පිරිසෙයින් වර්ෂයක් හෝ ඉගෙනුම් කටයුතුවල නිරත වීම;

*හෝ*

4.2 ජාතික පොදු අධ්‍යාපන සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් බුද්ධ ධර්මය විෂයය ඇතුළුව විෂයයන් හයකින් සමත් වී සිටීම හෝ ජ්‍යෝෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් බුද්ධ ධර්මය විෂයය සහිතව සමත් වී සිටීම;

*හෝ*

4.3 කොළඹ තරුණ බෞද්ධ සංගමය මගින් පවත්වන ලද බෞද්ධ ශිෂ්‍ය විභාගයේ ජ්‍යෝෂ්ඨ විභාගයෙන් සමත් වී සිටීම.

*සටහන.*— (i) මෙම විභාගය සඳහා ඉදිරිපත් වන සෑම අයදුම්කරුවකුම ඉහත 4 වැනි ඡේදයේ දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති බවට දහම් පාසල් ප්‍රධානාචාර්යවරයෙකු, පරිවේණාධිපතිවරයකු හෝ විද්‍යාලයාධිපතිවරයකු හෝ විසින් සහතික කළ යුතු ය.

(ii) විභාගාපේක්ෂකයන්ට මෙම විභාගය සඳහා ඉදිරිපත් විය හැක්කේ දහම් පාසල් අයදුම්කරුවකු වශයෙන් පමණකි.

05. *අයදුම් කිරීම :*

5.1 *දහම් පාසල් අයදුම්කරුවෝ.*—පසුගිය වසරේ හෝ ඊට පෙර වසරවල සිසුන් ඉදිරිපත් කළ සියලු ම දහම් පාසල් වෙත ප්‍රමාණවත් ඉල්ලුම්පත්‍ර සහ උපදෙස් පත්‍රිකා තැපැල් මගින් එවීමට කටයුතු සලසා ඇත. අයදුම්පත් නොලැබුණු යම් දහම් පාසලක් වේ නම්, දහම් පාසලේ නම, ලිපිනය, ඉදිරිපත් කරන අයදුම්කරුවන් ගණන යන විස්තර සඳහන් කොට මෙහි 5. 6 වැනි ඡේදයේ සඳහන් ලිපිනයට 2014.10.31 වැනි දිනට පෙර දැන්විය යුතු ය.

5.2 *බාහිර අයදුම්කරුවෝ.*—1999 වසරේ සිට බාහිර අයදුම්කරුවන් ලෙස කිසිදු අපේක්‍ෂකයකුට මෙම විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. එසේ වුවත්, ඉහත 4 වැනි ඡේදයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති යම් විභාග අපේක්ෂකයකු වේ නම්, තමන් පදිංචි ස්ථානයට ආසන්න දහම් පාසල මගින් රුපියල් 150 ක විභාග ගාස්තුවක් ගෙවා විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කළ හැකිය. මේ සඳහා අවශ්‍ය උපදෙස් සියලු ම දහම් පාසල් ප්‍රධානීන් වෙත ලබා දෙනු ඇත.

5.3 අදාළ දහම් පාසල් ප්‍රධානීන් විසින් ම ඉදිරිපත් කළ යුතු මෙම අයදුම්පත් පිටපත් දෙකකින් යුතුව සකස් කර මුල් පිටපත විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු අතර, අනෙක් පිටපත දහම් පාසල් ප්‍රධානියා වෙත තබා ගත යුතු ය. අයදුම්පත්‍ර දෙකෙහිම ප්‍රධානාචාර්යවරයා අත්සන් කර තිබිය යුතු ය.

5.4 අයදුම්පත්‍ර භාර ගැනීමේ අවසාන දිනය 2014.11.14 වැනි දින වේ.

5.5 අයදුම්පත්වල අපේක්ෂකයින්ගේ නම් ඇතුළත් කිරීමේදී උප්පැන්න සහතිකයේ සඳහන් ආකාරයටම විය යුතු අතර, ප්‍රතිඵල ලබාදීමෙන් පසුව නාම සංශෝධන සඳහා කරන ඉල්ලීම්වලදී, මුද්‍රණ දෝෂ හැරුණු විට වෙනත් ඉල්ලීම් සම්බන්ධව සලකා බලනු නොලැබේ. අයදුම්පත් පැහැදිළිව ද, නිවැරදිව ද සම්පූර්ණ කළ යුතු ය. එසේ නොවන අයදුම්පත් සහ අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5.6 දහම් පාසලේ පරිගණක අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළයුතු අතර, ලිපිනය වෙනස් වී නම් එය දැන්විය යුතු අතර, දහම් පාසල් ප්‍රධානාචාර්යවරයා සෘජුවම සම්බන්ධ කර ගත හැකි දුරකථන අංකය ද සඳහන් කරන්න. සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට යොමු කළ යුතු ය. අයදුම්පත් ලැබුණ බව දන්වා එවනු නොලැබේ.

විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන හා විදේශ විභාග ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1503, කොළඹ.

5.7 අයදුම්පත් බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ "දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2014" යනුවෙන් ද, ඉල්ලුම් කරන නගරය ද සඳහන් කළ යුතු ය.

5.8 කිසිදු සහතිකයක් අයදුම්පත් සමග අමුණා එවීම අවශ්‍ය නොවේ.

5.9 අයදුම්කරුවන්ගේ අදාළ සහතික පිළිබඳවත්, සුදුසුකම් ලබා තිබීම පිළිබඳවත්, අයදුම්පත් සහතික කරන පරිවේණාධිපතිවරයා, හෝ ප්‍රධානාචාර්යවරයා හෝ විද්‍යාලයාධිපතිවරයා හෝ වගකිව යුතු ය.

5.10 විභාගයට ඉල්ලුම් කරන ලද සෑම අයදුම්කරුවෙකුම, ඉල්ලුම් පත්‍රයේ සම්පූර්ණ කර ඇති තමාගේ සියලුම තොරතුරු නිවැරදිද යන්න පෞද්ගලිකවම පරීක්‍ෂාකර බලා අත්සන් කළ යුතු ය.

5.11 අයදුම්කරුවන් අත්සන් කර නැති, මකන දියර භාවිතා කරන ලද හා වෙනත් අඩුපාඩුකම් සහිත ඉල්ලුම් පත්‍ර මෙන්ම ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් කිසිම දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6. *විභාග ගාස්තු.*—මෙම විභාගය සඳහා නියමිත සම්පූර්ණ විභාග ගාස්තුව රුපියල් 150 කි. එහෙත් ප්‍රථම වතාවට ඉදිරිපත් වන දහම් පාසල් අයදුම්කරුවන් පමණක් මෙම විභාග ගාස්තුවෙන් නිදහස් කරනු ලැබේ. ඌන සාමාර්ථ්‍යය සම්පූර්ණ කිරීම සඳහා ඉල්ලුම් කරන විෂයයට විභාග ගාස්තුව රුපියල් 50 කි.

6.1 *විභාග ගාස්තු ගෙවීම.*—දහම් පාසල් ප්‍රධානාචාර්ය විසින් විභාග ගාස්තු ගෙවීමට නියමිත සියලු ම අයදුම්කරුවන්ගේ විභාග ගාස්තු එකතු කොට, දිවයිනේ ඕනෑම තැපැල් කාර්යාලයකට එම මුදල ගෙවා, එක් ලදුපතක් ලබාගෙන, එම ලදුපත අයදුම්පත්‍රයේ පසු පිටේ නොගැලවෙන සේ අලවා එවිය යුතු ය. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. (මුද්දර හා මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.).

6.2 *විභාග ගාස්තු ආපසු ගෙවීම.*—කුමන කරුණක් නිසාවත් මෙම විභාගය සඳහා ගෙවන විභාග ගාස්තුව වෙනත් විභාගයකට මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් හෝ සිදු කරනු නොලැබේ.

7. *ප්‍රවේශ පත්‍ර.*—විභාගයට ඇතුළත් කරගන්නා සෑම අයදුම්කරුවකු වෙතම විභාග කොමසාරිස් ජනරාල් විභාග විසින් ප්‍රවේශ පත්‍රයක්, ඉල්ලුම්පත් ඉදිරිපත් කළ දහම් පාසල් ප්‍රධානාචාර්ය මගින් නිකුත් කරනු ඇත.

7.1 විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවකු විසින් ම ස්වකීය ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවාගෙන, විභාගයට පෙනී සිටින ප්‍රථම අවස්ථාවේ දී ම විභාග ශාලාධිපති වෙත එය ඉදිරිපත් කළ යුතු ය. යම් අයදුම්කරුවකු තම ප්‍රවේශ පත්‍රය භාර නොදී සිටී නම් හා විභාග කොමසාරිස් ජනරාල් විසින් තමාට නියම කරන විභාග මධ්‍යස්ථානය හැර වෙනත් විභාග මධ්‍යස්ථානයක දී විභාගයට පෙනී සිටී නම්, ඔහුගේ විභාග අපේක්‍ෂකත්වය අහෝසි වනු ඇත.

7.2 ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන, දහම් පාසල් ප්‍රධානාචාර්යවරයකු හෝ පරිවේණාධිපතිවරයකු හෝ රජයේ විද්‍යාලයාධිපතිවරයකු හෝ වර්ෂයකට රුපියල් 2,40,360 කට වැඩි ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ ස්ථිර සේවයෙහි නියුතු මාණ්ඩලික නිලධාරියකු හෝ විසින් සහතික කළ යුතු ය.

7.3 විභාගය පැවැත්වීමට නියමිත දිනට සතියකටවත් පෙර ප්‍රවේශපත්‍රය, නොලැබුණහොත්, එකී දහම් පාසල් ප්‍රධානියා විසින් ඒ බව නොපමාව විභාග කොමසාරිස් ජනරාල් වෙත දැන්විය යුතු ය. එවැනි සෑම අවස්ථාවකදී ම පහත සඳහන් විස්තර සැපයිය යුතු ය :

1. විභාගයේ නම :————.
2. දහම් පාසලේ නම :————.
3. දහම් පාසලට ලබා දී ඇති පරිගණක අංකය :————.
4. අයදුම්කරුගේ සම්පූර්ණ නම හා ලිපිනය :————.
5. ඉල්ලුම් කළ විභාග මධ්‍යස්ථානය/නගරය :————.
6. ඉල්ලුම්පත්‍රය තැපැල් කළ තැපැල් කාර්යාලය :————.
7. ලියාපදිංචි කළ අංකය හා දිනය :————.
8. විභාග ගාස්තු ගෙවා ඇත්නම් එම ලදුපතේ අංකය, දිනය හා තැපැල් කාර්යාලය :————.

8. *අනන්‍යතාව.*—එක් එක් විෂයයට පෙනී සිටින සෑම අවස්ථාවකම විභාග ශාලාධිපතිට පිළිගත හැකිවන පරිදි අපේක්‍ෂකයන් විසින් තමන්ගේ අනන්‍යතාව ඔප්පු කිරීම සඳහා සූදානම්ව පැමිණිය යුතු ය. මේ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් පිළිගනු ලැබේ ;

8.1 පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,

8.2 වලංගු විදෙස් ගමන් බලපත්‍රය,

8.3 බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද භික්ෂු හැඳුනුම්පත,

8.4 තැපැල් හැඳුනුම්පත.

9. *සමත් බව තීරණය කිරීම හා ප්‍රතිඵල නිකුත් කිරීම.*—මෙම විභාගය සඳහා නියමිත විෂය ගණන හතරක් වන අතර, විභාගයෙන් සාමාර්ථය ලැබීම සඳහා සෑම විභාග අපේක්‍ෂකයකු ම එම විෂයයන් හතරෙන් ම සමත් විය යුතු ය. කෙසේ වෙතත් එක් වතාවක දී අදාළ විෂයය හතරෙන් එක් විෂයයක් පමණක් අසමත් නම් එය ඌන සාමාර්ථයක් ලෙස සලකනු ලැබේ. විභාගයට පෙනී සිටි වර්ෂයේ සිට අනුගාමී වසර දෙකක් (02) ඇතුළත දී එම ඌන සාමාර්ථය ලැබූ විෂයය සඳහා නැවත පෙනී සිට එය සමත් වී ඌන සාමාර්ථය සම්පූර්ණ කළ යුතු ය. (මෙය 2007 වසරේ විභාගයේ සිට බල පැවැත්වේ). ඌන සාමාර්ථ්‍යය ලබන සිසුන් ඌන සාමාර්ථය සම්පූර්ණ කිරීමේ දී විභාගයට ඉල්ලුම් කළ යුත්තේ අනිවාර්යයෙන් ම ඌන සාමාර්ථය ලැබූ විෂයයට පමණි.

9.1 පෙනී සිටින සෑම විෂයයකම එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු සියයක් (100) හිමිවන අතර ලබා ගන්නා එක් එක් ශ්‍රේණි සඳහා අදාළ ලකුණු පරාසයන් පහත සඳහන් පරිදි වේ.

| *ලකුණු පරාසය* | *ශ්‍රේණිය* | *සංකේතය* |
|---|---|---|
| 0 - 34 | අසමත් | F |
| 35 - 54 | සමත් | S |
| 55 - 69 | සම්මාන | C |
| 70 - 100 | විශිෂ්ට සම්මාන | D |

9.2 අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ලැයිස්තු අදාළ දහම් පාසල් ප්‍රධානීන් වෙත තැපැල් මගින් එවනු ලැබේ.

10. *සහතික පත්‍ර.*—මෙම විභාගයෙන් සමත් වන සෑම අයදුම්කරුවකුට ම සහතික පත්‍රයක් නිකුත් කිරීමට විධිවිධාන යොදනු ලැබේ. අදාළ සහතික පත්‍ර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් දහම් පාසල් ප්‍රධානාචාර්යවරුන් වෙත තැපැල් මගින් ලබා දෙනු ඇත. උක්ත විභාගය සමත්ව එහෙත් සහතික පත්‍රයක් නොලැබුණු යම් අපේක්‍ෂකයෙක් වේ නම්, ඒ පිළිබඳව දහම් පාසල් ප්‍රධානාචාර්ය මගින්ම විභාග කොමසාරිස් ජනරාල්, ප්‍රතිඵල ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ යන ලිපිනයට ලිපියක් මගින් විමසීම් කළ යුතු ය.

11. *උත්තර පත්‍ර නැවත සමීක්ෂණය.*—**දහම් පාසල් ප්‍රධානාචාර්ය-වරුන්ගේ ඉල්ලීම් මත පමණක්** උත්තර පත්‍ර නැවත සමීක්ෂණයට ඉඩදෙනු ලැබේ. විභාගයේ ප්‍රතිඵල නිකුත් වී දින 30ක් ඇතුළත මෙම දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන ආකෘති පත්‍රයකින් උත්තර පත්‍ර නැවත සමීක්ෂණය සඳහා ඉල්ලුම් කළ යුතු ය. මේ සඳහා වන ගාස්තු ප්‍රමාණයන් වරින් වර සංශෝධනය වීමට ඉඩ ඇති බැවින්, එය අදාළ අයදුම්පතෙහි දක්වනු ලැබේ. මෙම ගාස්තු ආපසු ගෙවනු ලබන්නේ මුලින්ම දෙන ලද ප්‍රතිඵලයක වෙනසක් කිරීමට සිදුවුවහොත් පමණකි. කවර හේතුවක් නිසාවත් අයදුම්කරුවන්ට හෝ ඔහුගේ නියෝජිතයින්ට හෝ උත්තර පත්‍ර පරීක්ෂා කර බැලීමට ඉඩ දෙනු නොලැබේ.

12. මෙම ව්‍යවස්ථා සහ විෂය නිර්දේශ සංග්‍රහයේ දක්වා ඇති විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීමට සියලුම විභාග අයදුම්කරුවන් බැඳී සිටින අතර, මෙහි විධිවිධාන සලසා නැති කවර හෝ යම් කරුණක් වෙතොත් එය විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි තීරණය වනු ඇත.

ඩබ්ලිව්. එම්. එන්. ජේ. පුෂ්පකුමාර,
විභාග කොමසාරිස් ජනරාල්.

2014 සැප්තැම්බර් මස 24 වැනි දින,
පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

*1 වැනි උපලේඛනය*

දිස්ත්‍රික්ක හා දිස්ත්‍රික්ක අංකත්, විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර හා නගර අංකත් පහත දැක්වේ :-

*දිස්ත්‍රික්කය — කොළඹ 01*

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| කොටහේන | 101 |
| මරදාන | 102 |
| බොරැල්ල | 103 |
| බම්බලපිටිය | 104 |
| මහරගම | 105 |
| ගල්කිස්ස | 106 |
| දෙහිවල | 107 |
| නුගේගොඩ | 108 |
| මොරටුව | 109 |
| පිළියන්දල | 110 |
| හෝමාගම | 111 |
| අවිස්සාවේල්ල | 112 |

*දිස්ත්‍රික්කය — ගම්පහ 02*

| | |
|---|---|
| ගම්පහ | 201 |
| වේයන්ගොඩ | 202 |
| මිනුවන්ගොඩ | 203 |
| මීරිගම | 204 |
| මීගමුව | 205 |
| වත්තල | 206 |
| කැළණිය | 207 |

*දිස්ත්‍රික්කය — කළුතර 03*

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| කළුතර | 301 |
| පානදුර | 302 |
| අළුත්ගම | 303 |
| හොරණ | 304 |
| මතුගම | 305 |
| මීගහතැන්න | 306 |

*දිස්ත්‍රික්කය — මාතලේ 04*

| | |
|---|---|
| මාතලේ | 401 |
| ගලේවෙල | 402 |
| දඹුල්ල | 403 |
| නාඋල | 404 |
| ලග්ගල - පල්ලේගම | 405 |

*දිස්ත්‍රික්කය — මහනුවර 05*

| | |
|---|---|
| මහනුවර | 501 |
| කටුගස්තොට | 502 |
| නුගවෙල | 503 |
| තෙල්දෙනිය | 504 |
| මැද මහනුවර | 505 |
| වත්තේගම | 506 |
| ගලහ | 507 |
| ගලගෙදර | 508 |
| ගම්පොළ | 509 |
| නාවලපිටිය | 510 |
| පිළිමතලාව | 511 |

*දිස්ත්‍රික්කය — නුවරඑළිය 06*

| | |
|---|---|
| නුවරඑළිය | 601 |
| හැඳුනුවැව | 602 |
| හැටන් | 603 |
| ගිනිගත්හේන | 604 |
| හඟුරන්කෙත | 605 |
| වලපනේ | 606 |

*දිස්ත්‍රික්කය — ගාල්ල 07*

| | |
|---|---|
| ගාල්ල | 701 |
| අම්බලන්ගොඩ | 702 |
| බලපිටිය | 703 |
| ඇල්පිටිය | 704 |
| බද්දේගම | 705 |
| උඩුගම | 706 |
| අහංගම | 707 |

*දිස්ත්‍රික්කය — මාතර 08*

| | |
|---|---|
| මාතර | 801 |
| වැලිගම | 802 |
| කඹුරුපිටිය | 803 |
| හක්මන | 804 |
| දික්වැල්ල | 805 |

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| අකුරැස්ස | 806 |
| දෙනියාය | 807 |
| කොටපොල | 808 |

*දිස්ත්‍රික්කය — හම්බන්තොට 09*

| | |
|---|---|
| හම්බන්තොට | 901 |
| වලස්මුල්ල | 902 |
| වීරකැටිය | 903 |
| තංගල්ල | 904 |
| අම්බලන්තොට | 905 |
| බෙලිඅත්ත | 906 |
| තිස්සමහාරාමය | 907 |
| අගුණකොළපැලැස්ස | 908 |

*දිස්ත්‍රික්කය — වවුනියාව 10*

| | |
|---|---|
| වවුනියාව | 1001 |

*දිස්ත්‍රික්කය — ත්‍රිකුණාමලය 11*

| | |
|---|---|
| ත්‍රිකුණාමලය | 1101 |
| කන්තලේ | 1102 |

*දිස්ත්‍රික්කය — අම්පාර 12*

| | |
|---|---|
| අම්පාර | 1201 |
| සේරංකඩ | 1202 |
| මහඔය | 1203 |
| දෙහිඅත්තකණ්ඩිය | 1204 |

*දිස්ත්‍රික්කය — පුත්තලම 13*

| | |
|---|---|
| පුත්තලම | 1301 |
| ආණමඩුව | 1302 |
| හලාවත | 1303 |
| වෙන්නප්පුව | 1304 |

*දිස්ත්‍රික්කය — කුරුණෑගල 14*

| | |
|---|---|
| කුරුණෑගල | 1401 |
| පොල්ගහවෙල | 1402 |
| ඉබ්බාගමුව | 1403 |
| මැල්සිරිපුර | 1404 |
| කුලියාපිටිය | 1405 |
| හෙට්ටිපොල | 1406 |
| නිකවැරටිය | 1407 |
| මහව | 1408 |
| ගල්ගමුව | 1409 |

*දිස්ත්‍රික්කය — අනුරාධපුර 15*

| | |
|---|---|
| අනුරාධපුරය | 1501 |
| මැදවච්චිය | 1502 |
| කැකිරාව | 1503 |
| පදවිය | 1504 |
| ගලෙන්බිඳුනුවැව | 1505 |

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| තඹුත්තේගම | 1506 |
| හොරොව්පතාන | 1507 |
| නොච්චියාගම | 1508 |

*දිස්ත්‍රික්කය — පොළොන්නරුව 16*

| | |
|---|---|
| පොළොන්නරුව | 1601 |
| මනම්පිටිය | 1602 |
| හිඟුරක්ගොඩ | 1603 |
| මැදිරිගිරිය | 1604 |

*දිස්ත්‍රික්කය — බදුල්ල 17*

| | |
|---|---|
| බදුල්ල | 1701 |
| වැලිමඩ | 1702 |
| බණ්ඩාරවෙල | 1703 |
| පස්සර | 1704 |
| මහියංගනය | 1705 |
| ගිරාඳුරුකෝට්ටේ | 1706 |
| මීගහකිවුල | 1707 |

*දිස්ත්‍රික්කය — මොණරාගල 18*

| | |
|---|---|
| මොණරාගල | 1801 |
| බිබිල | 1802 |
| වැල්ලවාය | 1803 |
| කතරගම | 1804 |
| දොඹගහවෙල | 1805 |

*දිස්ත්‍රික්කය — කෑගල්ල 19*

| | |
|---|---|
| කෑගල්ල | 1901 |
| අරණායක | 1902 |
| රඹුක්කන | 1903 |
| මාවනැල්ල | 1904 |
| රුවන්වැල්ල | 1905 |
| යටියන්තොට | 1906 |
| වරකාපොළ | 1907 |

*දිස්ත්‍රික්කය — රත්නපුර 20*

| | |
|---|---|
| රත්නපුර | 2001 |
| ඇහැලියගොඩ | 2002 |
| පැල්මඩුල්ල | 2003 |
| බලංගොඩ | 2004 |
| ඇඹිලිපිටිය | 2005 |
| රක්වාන | 2006 |
| කලවාන | 2007 |

***විභාග විෂයය හා විෂයය නිර්දේශය***
***(1993 සිට ඉදිරියට පැවැත්වෙන විභාග සඳහා)***

මෙම විභාගය පැය 03 බැගින් වූ ප්‍රශ්න පත්‍ර 4 කින් සමන්විතය.

*I වැනි ප්‍රශ්න පත්‍රය*

**බුද්ධ චරිතය**

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් යුක්ත ය.

*I වැනි කොටස*

බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ සමයෙහි පැවති භාරතීය සමාජය අවබෝධකර ගැනීම. :—

(අ) සාමාජික පසුබිම
(ආ) දේශපාලනික පසුබිම
(ඇ) ආර්ථික පසුබිම
(ඈ) ආගමික හා දාර්ශනික පසුබිම

*II වැනි කොටස - බුද්ධ චරිතය*

(අ) සිද්ධාර්ථ කුමාරෝත්පත්තියේ සිට සම්බුද්ධ පරිනිර්වාණය තෙක් බුද්ධ චරිතය.
(ආ) බුද්ධ චරිතයේ කැපී පෙනෙන විශිෂ්ට ලක්‍ෂණ - තාදී ගුණය, අසරණයන්ට පිහිටවීම, ගිලනුන්ට උපස්ථාන කිරීම, හික්මවිය යුතු පුද්ගලයන් හික්මවීම, ඉවසීම, අන්‍යමත ඉවසීම
(ඇ) බුදුරජාණන් වහන්සේගේ ලොව්තුරු ගුණ
(ඈ) බුදුරජාණන් වහන්සේගේ සමාජ ශෝධකත්වය
(ඉ) බුදුරජාණන් වහන්සේගේ නායකත්වය

*III වැනි කොටස - බුදුරජාණන් වහන්සේගේ සිව්වණක් පිරිස*

(අ) *භික්ෂු* - පස්වග භික්ෂූන්, සැරියුත් මුගලන්, මහා කාශ්‍යප, ආනන්ද, සීවලී, මහා කච්චාන, පුණ්ණමන්තානි පුත්ත, කුමාර කාශ්‍යප යන රහතන් වහන්සේ පිළිබඳ දැනුම.
(ආ) *භික්ෂුණී* - මහාප්‍රජාපතී ගෝතමී, ඛේමා, උප්පලවණ්ණා, භද්දකච්චානා, ධම්මදින්නා, අම්බපාලි, පටාචාරා යන තෙරණින් වහන්සේ පිළිබඳ දැනුම.
(ඇ) *උපාසක* - සේනිය, බිම්බිසාර, පසේ නදි කෝසල, අජාසත්, අනාථ පිණ්ඩික, ධම්මික යන උපාසකවරුන් පිළිබඳ දැනුම.
(ඈ) *උපාසිකා* - විශාඛා, කෝසල මල්ලිකා, සාමාවතී, ඛුජ්ජුත්තරා යන උපාසිකාවන් පිළිබඳ දැනුම.

*2 වැනි ප්‍රශ්න පත්‍රය*

**බුද්ධ ධර්මය හා පාලි භාෂා පරිචය**

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් සමන්විත ය.

*I වැනි කොටස - බුද්ධ ධර්මයේ මූලික ඉගැන්වීම*

(අ) පටිච්ච සමුප්පාදය
(ආ) චතුරාර්ය සත්‍යය
(ඇ) ත්‍රිලක්‍ෂණය
(ඈ) කර්මය සහ පුනර්භවය
(ඉ) නිර්වාණය

මෙම ධර්ම කරුණු පිළිබඳව ථෙරවාදී බෞද්ධ සම්ප්‍රදායයෙහි අර්ථ විවරණය පිළිබඳ සාමාන්‍ය අවබෝධය.

*II වැනි කොටස - භාවනා සහ අභිධර්මය*

(අ) සමථ, විපස්සනා භාවනා
(ආ) අභිධර්මයෙහි සතර පරමාර්ථ ධර්ම පිළිබඳ සාමාන්‍ය දැනුම

*III වැනි කොටස - පාලි භාෂා පරිචය*

පහත සඳහන් ගාථා සහ පාඨ සිංහලට පරිවර්තනය කිරීම :—

(අ) ධම්මපදය - යමක වග්ග 19, 20 ගාථා, පුප්ඵ වග්ග 03 වැනි ගාථාව, බාල වග්ග - 05, 06, 10, 14, 15 ගාථා පණ්ඩිත වග්ග, 12, 13, 14 ගාථා.

(ආ) චතු භාණවාර පාලි -
(i) මිත්තානිසංස සුත්ත
(ii) මෙත්තානිසංස සුත්ත
(iii) ඛන්ධ පරිත්ත

(ඇ) රසවාහිණී - දුට්ඨ ගාමිණී අභය මහාරඤ්ඤවත්ථු

(ඈ) වන්දනා ගාථා සහ පාඨ—
(i) තෙරුවන් ගුණ පාඨ සහ වන්දනා ගාථා
(ii) ආමිස පූජා ගාථා

*3 වැනි ප්‍රශ්න පත්‍රය*

**ශාසන ඉතිහාසය**

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් යුක්ත ය.

(i) භාරතීය ශාසන ඉතිහාසය
(ii) ශ්‍රී ලංකා ශාසන ඉතිහාසය

*I වැනි කොටස - භාරතීය ශාසන ඉතිහාසය*

(අ) බෞද්ධ ධර්මදූත සේවාවේ ආරම්භය සහ බුද්ධ කාලීන ශාසන ව්‍යාප්තිය
(ආ) ධර්ම සංගායනා සතර
(ඇ) අශෝක සමය
(ඈ) අශෝක රජතුමා බෞද්ධයකු වීම
(ඉ) අශෝක ධර්මය
(ඊ) අශෝක රජුගේ ලෝක ශාසනික සේවාව
(උ) බෞද්ධ ඉතිහාසයේ අශෝක රජතුමාට හිමි තැන අගය කිරීම

*II වැනි කොටස - ශ්‍රී ලංකා ශාසන ඉතිහාසය*

(අ) මහින්දාගමනය සහ බුද්ධ ශාසන ප්‍රතිෂ්ඨාපනය
(ආ) භික්ෂුණී සමාජය
(ඇ) ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩම කරවීම
(ඈ) දන්ත ධාතුන් වහන්සේ වැඩම කරවීම
(ඉ) මහා විහාරය
(ඊ) අභයගිරි විහාරය
(උ) ජේතවන විහාරය
(ඌ) ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම
(එ) බුදු සමයෙන් ලක්වැසියන් ලද ආභාෂය

*4 වැනි ප්‍රශ්න පත්‍රය*

***බෞද්ධ සංස්කෘතිය***

මෙම ප්‍රශ්න පත්‍රය බෞද්ධ සිරිත් විරිත්, ශ්‍රී ලංකාවේ කලා ශිල්ප හා ලෝක බෞද්ධ සංස්කෘතිය යන කොටස් තුනකින් යුක්ත වෙයි.

***I වැනි කොටස - බෞද්ධ සිරිත් විරිත්***

(අ) බෞද්ධ සිරිත් විරිත්වල වැදගත්කම
(ආ) බෞද්ධ ආරාම (පැවිදි) ජීවිතය ආශ්‍රිත සිරිත් විරිත්
(ඇ) ආරාම ජීවිතය පදනම් වූ බෞද්ධ ගිහි සිරිත් විරිත්
(ඈ) ගිහි පවුල් ජීවිතය සම්බන්ධ සිරිත් විරිත්
(ඉ) ශාසනික කටයුතු පිළිබඳ සිරිත් විරිත්

(සාංඝික දාන, කඨින දාන, ධර්ම දේශනා හා ධර්ම ශ්‍රවණ, පිරිත් පින්කම් හා බෝධි පූජා) බෞද්ධ උත්සව.

***II වැනි කොටස - ශ්‍රී ලංකාවේ බෞද්ධ කලා ශිල්ප***

බුදු දහමෙන් සිදු වූ කලා පෝෂණය.
බෞද්ධ ගෘහ නිර්මාණ ශිල්පය. (ස්ථූප, චෛතියඝර, බෝධිඝර, පඨමාඝර)

බෞද්ධ මූර්ති, කැටයම් හා චිත්‍ර කලාව—

(i) *බුදු පිළිමය.*—උපත හා ව්‍යාප්තිය, අනුරාධපුර සමාධි පිළිම, තොලුවිල සමාධි පිළිමය, අවුකන බුදු පිළිමය, ගල් විහාරේ බුදු පිළිම.

(ii) *කැටයම්.*—වාහල්කඩ, සඳකඩ පහණ, මුරගල්, කොරවක්ගල් හා පියගැට.

(iii) *බෞද්ධ චිත්‍ර කලාව.*—අනුරාධපුර, පොළොන්නරුව හා මහනුවර යුගයේ බිතුසිතුවම්. (මහියංගන ධාතු ගර්භය, තිවංක පිළිමගේ, දෙගල්දොරුව, කැලණියේ අළුත් විහාරය, ගෝතමී විහාරය යන ස්ථානවල බිතු සිතුවම්)

***III වැනි කොටස - සිංහල බෞද්ධ සාහිත්‍යය***

බෞද්ධ කථා සාහිත්‍යයේ ආචාර, විද්‍යාත්මක වටිනාකම, ජාතක පොත, සද්ධර්මරත්නාවලිය හා පූජාවලිය පිළිබඳ සාමාන්‍ය දැනීම.

සිංහල භක්ති කාව්‍යය.—බුදුගුණ අලංකාරය හා තුන් සරණය පිළිබඳ සාමාන්‍ය දැනුම

***IV වැනි කොටස - ලෝක බෞද්ධ සංස්කෘතිය***

පහත සඳහන් රටවලට බුදු දහම පැමිණීම, ව්‍යාප්තිය හා බෞද්ධ සංස්කෘතික ලක්ෂණ පිළිබඳ සාමාන්‍ය දැනුම—

(අ) මියන්මාර් (බුරුමය)
(ආ) තායිලන්තය
(ඇ) චීනය
(ඈ) ජපානය

*පරිශීලනය කළ යුතු ග්‍රන්ථ* :

බෞද්ධ සංස්කෘතිය - සිරිසීවලී හිමි
කලා ශිල්ප හා සාහිත්‍ය - ඩී. ආර්. ජයවර්ධන මයා

අතිරේක කියවීම් පොත් :
බුදු සිරිත - ආචාර්ය කේ. ඩී. පී. වික්‍රමසිංහ මයා

10-502

---

සංශෝධනයයි

**අධ්‍යාපන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2 වන පන්තියේ II වන ශ්‍රේණියේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය — 2014

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2014.09.05 දිනැති අංක 1,879 දරන *ගැසට් පත්‍රයේ* පළවූ ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 2 වන පන්තියේ II වන ශ්‍රේණියේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2014 සඳහා අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2014.10.21 දක්වා දීර්ඝ කරනු ලැබේ.

අනුර දිසානායක,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2014 ඔක්තෝබර් මස 07 වැනි දින,
ඉසුරුපාය,
පැලවත්ත, බත්තරමුල්ල,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

10-813

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.